
# නරක මිතුරු ඇසුර



B.A.THISENI ONADEE BANDARA

# නරක මිතුරු ඇසුර

B.A.THISENI ONADEE BANDARA

# නරක මිතුරු ඇසුර

බී.ඒ.තිසෙනි ඔනාදි බණ්ඩාර

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

මහනුවර

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- ගස් මුදුනේ සිට ගී ගයන කොහාගේ සත්‍ය කතාව
- කඩිසර කූඹියෝ
- කවි සහ තේරවිලි

ISBN– 978 – 624 – 208 - 185 - 4

# <u>පිදුම</u>

මිණිකැට මෙන් මුතු අකුරු එකිනෙක

පද බැද

සිප් සතර මුල පුරන්නට දිරිය දුන්

මාගේ භද්‍රා ගුරු මෑණියන්ටද

නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්

හිදිමින් සියලු කාර්යන්ට ශක්තියක්

වන

මාගේ මවට , පියාට

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙනේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතිය ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක ගමක තාත්තයි පුතාලා තුන්දෙනෙකුයි ජීවත් වුණා.



ටිකෙන් ටික ලොකු වෙන දරුවන් තුන්දෙනා ගමේ සිටින නරක යහළුවන් ඇසුරු කරන්නට වුණා.



මෙය දැනගත් පියා ඉතාමත් දුක් වුණා. පියා අවවාද කරමින් තරවටු කරමින් ඔවුන්ව යහමගට ගන්නට උත්සාහ කළත් එය හරි ගියේ නැ.



කුමක් කරන්නද කියා පියා කල්පනා කරන්නට විය.


පියා මහන්සි වී කුඹුරු වැඩ කලත් ඒවාට දරුවන් කිසිම සහයෝගයක් දැක්වුයේ නැ.

උදේ පටන්ම දරුවන් ගමේ සිටින නරක ගති ඇති යහළුවන් සමග එක් වී විවිධ නොමනා වැඩ කරන්නට වුණා.

ගමේ මිනිසුන් මේ ගැන පියාට වරින් වර කියන්නට වුයෙන් පියා ද ඉතා දුකට පත් වුණා. තම දරුවන් මේ කරදරයෙන් ගලවා ගන්නේ

කෙසේ දැයි පියා කල්පනා කලා.

දවසක් හොඳින් ඉදුණු අඹ කූඩයක් නිවසට ගෙනවිත් එම කූඩයේ ඉදුණු අඹ මැදට නරක් වූ අඹ ගෙඩියක් ද තබා දරුවන්ට දුන්නා. නමුත් එම අඹ පසු දින උදෑසන කෑමට ගන්නා ලෙස පියා කීවා.



පසු දින උදෑසන අවදි වූ දරුවන් අඹ කෑමට සිතා කූඩය දෙස බලන විට අඹගෙඩි සියල්ල නරක් වී තිබෙනු දුටුවා.

එය එසේ වූයේ කොහොමදැයි පියාගෙන් විමසන්නට විය.

හොඳ අඹගෙඩි මධ්‍යයේ නරක් වු එක් අඹ ගෙඩියක් තබා තිබු බව පියා පෙන්වා දුන්නා.




එම එක අඹගෙඩිය නිසා අනෙක් ඉදුණු අඹගෙඩි සියල්ල නරක් වුණා.



ඒ වගේ තමයි ඔයාලත් නරක ගති ඇති එක් යහළුවෙක් හෝ ආශ්‍රය කළොත් එම නරක ගති නිසා තමන්ද විනාශ වී යන බව පියා දරුවන්ට පැහැදිලි කර දුන්නා.

එය තේරුම්ගත් දරුවන් පියාගෙන් සමාව අයැද සිටියා.





ඉතා දුක් මහන්සියෙන් තම දරුවන් පෝෂණය කරන දෙමාපියන් හට දුකක් නොදී නරක යහළුවන් ආශ්‍රය නොකර යහපත් ලෙස ජීවත් වෙන්න. අපිත් අද සිට සිතට ගනිමු.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනය ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ ධරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ ඔක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්